

# නාට්‍ය, වේදිකාව, රංගය සහ මෙල්බර්න් ප්‍රජාව - 3



ආචාර්ය
තරංග
දන්දෙනිය

මෙල්බන් පුරවර සිටින අප, තම ප්‍රජාව ආශ්‍රිත රංගයන් බොහෝමයක් නැරඹීමට අවස්ථාව ලද්දෝහුය. ඇතැමෙක් ඒ රංග ක්‍රියාකාරකම් ප්‍රයුංජනයෙහි ලා දායක වන්නොහුය. මේ රංග ක්‍රියාකාරකම් හි ආකෘතීන් සහ වර්ග විශේෂයන් හි පරාසය සංකීර්නය. එය පෙර කී පරිදි, මෝස්තර නිරූපනය, අවුරුදු පොලක සාස්තර කීම හෝ කඨින පිංකමක නර්ථනයේ සිට, සංවර්ධිත නර්තන, සංගීත වේදිකා නාට්‍ය රංග දක්වා පරාසයකට අයිතිය. එහෙත්, අවුරුදු පොළක අංගයක් හෝ මෝසතර නිරූපනයක් යන්න රංගයක් යන අර්ථයෙන් ලා බොහෝ දෙනෙක් නොසලකති. එයට හේතුව වන්නේ ඔවුන්ගේ නිර්ණායක සැකසී ඇත්තේ රංග කලාව පිළිබඳ දැනට පවතිනා පොදු මතවාද අනුව නිසාය. එබැවින් ' නාට්‍ය' යන වචනය ඇතැමෙකුට දැනෙනුයේ දෙබස්, නර්ථන, සහ සංගීත සහිත ප්‍රසාංගිකාත්මක කාර්යයක් ලෙසය. එහි වැරැද්දක් නොමැත. පෙරදිග, විශේෂයෙන්ම සංස්කෘත රංගවේදයේ හි දස වර්ගයක් ලෙස දක්වන රංග විශේෂතා අතර වැඩි වශයෙන් අසාධාරණයට ලක් කොට ඇත්තේ ද, අප ශ්‍රී ලාංකීය නාට්‍ය කලාව වැඩි වශයෙන් නියෝජනය කරන්නේ ද, දෙබස් සහිත කථන රංග ස්වරූපයන්ය.

ඒ සංකීර්ණතාවය අවබෝධ කරගැනීම සඳහා, සංස්කෘත නාට්‍ය කලාවේ දක්වන වර්ගීකරණයක් වන 'නෘත' 'නෘත්‍ය' සහ නාට්‍ය පිළිබඳ අවබෝධය වැදගත්ය. 'නෘත්‍ය' සහ 'නාට්‍ය' ඉහත කී ලෙසම සංවර්ධිත අවස්ථා වන අතර, 'නෘත' ලෙස හඳුන් වනු ලබන්නේ හුදු රංග රූපී ක්‍රියාවය.

පෙරදිග අනුව, නාට්‍ය කී කල්හි, පෙළ මෙන්ම රංගය ඇතුලත් නමුදු නූතන අපරදිග දැක්ම අනුව නාට්‍ය (Drama) යනු පෙළ මූලික සාහිත්‍යමය තත්වයකි. වේදිකාව (Theatre) යනු, අධ්‍යක්ෂකයකු විසින් වේදිකාව හෝ පිළිගත හැකි රංග අවකාශයක රංග ක්‍රියාවක් බවට අනුවර්තනය කළ දෙයකි. රංගය (Performance) යනු මේ සියල්ල ඇතුලත් 'ආවරන' නාමයකි. එහි 'නෘත' සිට 'නාට්‍ය' දක්වා සියල්ල අඩංගය, රංගය නිශ්චිත පෙළක් මෙන්ම අධ්‍යකෂකයෙකු නොමැතිව ඇති විය හැකිය. එය සම්ප්‍රදායික රංග කලාවට වඩා සංකීර්ණය. එමෙන්ම, එහි සම්ප්‍රදායික නළුවා සහ ප්‍රේක්ෂකයා සංකල්පය ද වෙනස්ය. මේ පිළිබද ඉදිරියේදී කතා කරනට කැමැත්තෙමි.

ඉහත රංග රූපී ක්‍රියා ගැන කතාවට මා පිවිසුනේ, නිර්මාණ කරුවෙකු හෝ ප්‍රේක්ෂකයෙකු ලෙස මේ විෂයෙහි නිරතවෙන්නා ගේ දැනුවත්භාවය උදෙසාය. අවබෝධාත්මක ප්‍රේක්ෂකයා සංස්කෘත කලා සිද්ධාන්ත (නාට්‍ය ශාස්ත්‍රයේදී) හැඳින්වූයේ 'සුමිනස් ' කියාය. අභිනවගුප්ත වැනි පසුකාලීන සිද්ධාන්තකරුවන් මෙය හඳුන්වන ලද්දේ 'සහෘදයා' යන වචනයෙනි. එනමුඳු, ඉවක් බවක් නැතිව කීම නිසා මෙහි අර්ථය ගෙවී ගොසිනි. 'සහෘදයා' යනු 'නිර්මාණකරුවා හා සමාන හෘදයක් ඇත්තා වූ' හෙවත් නිර්මාණයෙන් නිර්මාණකරුගේ ආකල්ප එලෙසම පිරිසිඳ දකින්නාය. එහෙත්, එකට වැඩෙන ඇතැම් නිවුන්නු ද රසය අතින් වෙනස් ආකල්ප දරන අයුරු දකින කළ නිර්මායක 'සහෘදයා' යන්න මට ගැටළුවකි.

මා යෙදීමට කැමති 'සුමිනස් ' යන වදනයි. 'සුමිනස් ' ප්‍රේක්ෂකයෝ ආවාට ගියාට පහල වන්නේ නැත. එය වර්ධනය කරගත යුතු තත්වයකි. ගුණාංග වල එකතුවකි. නාට්‍ය ශාස්ත්‍රය දක්වන පරිදි එවැනි ප්‍රේක්ෂකයා ප්‍රසන්න මනෝභාවකින් ද, යම් අධ්‍යාපනයකින් ද, යහපත් චරිතයකින් ද, පරිනතභාවයකින් ද, කලා කුසලතාවෙන් ද, මෙන්ම රංග කලා විධීන් පිළිබඳ දැනුමකි න් ද යුතුවීම අවශ්‍යය. මා දකින්නේ, නිර්මාණකරුවකු ශතත අභ්‍යාසයෙන් තම කුසලතා දියුණු කරගන්නාක් මෙන්ම, ප්‍රේෂකයා ද ඒ තත්වය අත්කළ ගත යුතු බවය. විවිධ රංග නැරඹීමෙන් ද, ඒ පිළිබඳ වැඩි දුර කියවීමෙන් ද පමණක් නොව, ඒ ගැන සිතීම නිසා ද ප්‍රේක්ෂයා පරිනත සහ දැනුවත් භාවයට පත් වෙතැයි මගේ හැඟීමය.

කෙසේ වෙතත්, නිර්මාණ කිරීමේදී මෙන්ම නිර්මාණ වින්දනය ද සිදුවන්නේ පුද්ගල රුචි අරුචිය සහ රසය අනුවය. අපරදිගයන් 'අත්දැකීම යැයි' කීවද පෙරදිග, බොහෝවුන් නිර්මාණකින් විදින්නේ 'රසයක් ' හෙවත් සෞන්දර්යාත්මක සංතෘෂ්ටියක්ය. මා කළකට පෙර මෙල්බර්න් නුවර ප්‍රේක්ෂගාරයක කළ සමීක්ෂණයකින් හෙලිවූයේ බහුතරයක් හාස්‍ය සහ ශෘංගාර රස ජනිත නිර්මාණ නැරඹීමට කැමති බවය.

**<u>රසය, ප්‍රේක්ෂකයා සහ නිර්මාණකරුවා (නළු නිළියන්) දෙපාර්ශවයම එක්ව විඳින්නක් යැයි කිව හැක්කකි. චිත්‍රපටයක උද්වේගකර සටනකදී ඔබ ආතතියෙන් නරඹන්නේ ත්, ශෘංගාරාත්මක ප්‍රේම ජවනිකාවක උණුසුම් හැඟීමක් දනවන්නේ ත්, ඔබ ද රස විඳිනවා මෙන්ම එම රංග ක්‍රියාවේම කොටසක් බවට පත්වන බැවින්ය.</u>**

අලුතින් යමක් නැරඹීමේදී, ඒ පිළිබඳ වටහා ගැනීම සහ රීතින් හඳුනා ගැනීම, රස වින්දන පරාසය පුළුල් කිරීමට හේතු කාරකයකි. රසය හෝ මූලික අත්දැකීම එය ඉදිරිපත් කරනා ආකෘතිය හෝ රංග වර්ගය තීරණය කිරීමට හේතු කාරකයකි. ග්‍රීක නාට්‍ය කලාවේ ඇවෑමෙන් අපරදිග රංග කලාව අත්පත් කරගත් 'ට්‍රැජඩි' සහ 'කොමඩි' වර්ගයේ නාට්‍ය විශේෂතාවයන් ප්‍රධාන කරගන්නේ 'ශෝක' හෝ 'හාස්‍ය' ජනනය කරනා ක්‍රියාවලීන්ය. ඒ සඳහා යොදා ගන්නා රීතීන් අනුව රංග වර්ගීකරනය (ටැබරැ) ඇතිවේ.

සංස්කෘත නාට්‍යධර්ම අනුව හාස්‍ය හෝ ශෝකය යනු රසයන්ය. රසය ජනනට වනුයේ 'අනුභාව', 'විභාව' සහ 'ව්‍යාභිචාරී භාව' යන්නේ එකතුව නිසා කියාය. ඒ අනුව ශෝක, කරුණා, හාස්‍ය, ශෘංගාර වැනි රස ජනනය වේ. මේවායින් එකක් හෝ කිහිපයක් රංගයක ප්‍රධාන වෙයි. උදාහරණයකින් වැඩි දුර පැහැදිලි කරන්නේ නම්, ශෘංගාරය නම් රසය ඇතිවීමට හේතුවන්නේ ප්‍රේමවන්තයෙකු සහ ප්‍රේමවන්තියක අතරෙහිය. (මේ සම්ප්‍රදායික උදාහරණය පිළිබඳව කමත්වා) දෙදෙනාගේ දැක්මෙන් උත්තේජනය වන මූලික භාවය 'රති' නම් සථිර භාවයයි. එය පාරිසරික සාධක (ප්‍රේමයට උචිත මද අඳුර, සුවඳ, සඳ එළිය) මත තීව්‍ර වෙයි. වාචික අවාචික අභිනය මගින් එය ප්‍රකාශ කිරීම 'අනුභාව' ය. ව්‍යාභිචාරීභාව යනු එම සථිර භාව රසයක් බවට පත්කිරීමට කරනා භාවමය විපර්යාසයයි.

රසය, ප්‍රේක්ෂකයා සහ නිර්මාණකරුවා (නළු නිළියන්) දෙපාර්ශවයම එක්ව විඳින්නක් යැයි කිව හැක්කකි. චිත්‍රපටයක උද්වේගකර සටනකදී ඔබ ආතතියෙන් නරඹන්නේ ත්, ශෘංගාරාත්මක ප්‍රේම ජවනිකාවක උණුසුම් හැඟීමක් දනවන්නේ ත්, ඔබ ද රස විඳිනවා මෙන්ම එම රංග ක්‍රියාවේම කොටසක් බවට පත්වන බැවින්ය. මේ ගැන වැඩිදුර සිතන්නේ නම් ඔබ නිර්මාණ කරුවකු සහ ප්‍රේක්ෂකයෙකු බවට එකවර පත්වෙන අයුරු

16 වන පිටට